# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1957/30 - 2016 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2016.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

2016 අංක 01 දරන පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය ප්‍රඥප්තිය

2016.02.16 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2016.02.23 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

**2016 අංක 01 දරන පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය ප්‍රඥප්තිය**

2016.02.09 වන දින සභා සම්මත කරන ලදුව 2016.02.23 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද 2016 අංක 01 දරන පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පාලිත නානායක්කාර,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2016 පෙබරවාරි මස 03 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

සබරගමුව පළාතේ 2016 අංක 01 දරන

පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය

පිහිටුවීමට අදාළ

ප්‍රඥප්තිය

1A - PG 2883 — 12 (2016/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සබරගමුව පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන

## පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය

## පිහිටුවීමට අදාළ ප්‍රඥප්තියයි

ප්‍රාග් ඓතිහාසික යුගයට නෑකම් කියනු ලබන සබරගමුව පළාතේ පැවති ඉපැරණි ගමක ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාපනික උරුමයන් සහ ශ්‍රී විභූතිය අනාගත පරපුරට දැක ගැනීමට සලසනු වස් තේමා උද්‍යානයක් පිහිටුවීම හා ඊට සම්බන්ධිත භාරකාර මණ්ඩලය හෝ ආනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*ක්‍රියාවට නැංවීම හා ලුහුඬු නාම*

1\. 1.1 මෙම ප්‍රඥප්තිය 2016 අංක 01 දරන ''පින්නවල ඉපැරණිගම'' තේමා උද්‍යානය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

1.2 මින්මතු තේමා උද්‍යානය යනුවෙන් පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය අර්ථ ගැන්වෙන අතර මෙහි 04 වන වගන්තියේ සඳහන් අය භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සැලකිය යුතු ය.

1.3 පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඒකකයක් ලෙස ක්‍රියාවට නංවනු ලබන අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය.

1.4 මෙහිදී අමාත්‍යවරයා යනුවෙන් අර්ථ ගැන්වෙන්නේ සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වේ.

1.5 භාරකාර මණ්ඩලය යන්න ''පින්නවල ඉපැරණිගම'' භාරකාර මණ්ඩලය වශයෙන් දැක්වේ.

1.6 ගිණුම යන්නෙන් පින්නවල ඉපැරණි ගම තේමා උද්‍යානයට අදාළ ගිණුම දැක්වේ.

1.7 ආණ්ඩුකාරවරයා යන්න සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා අර්ථ ගැන්වේ.

1.8 ලේකම් යන්නෙන් සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා අර්ථ ගැන්වේ.

*තේමා උද්‍යානය පහත අරමුණු ළඟාකර ගැනීම සඳහා පිහිටුවනු ලබන්නේ ය.*

2\. 2.1 ප්‍රාග් ඓතිහාසික යුගයට නෑකම් කියන සබරගමුව පළාතේ ඉපැරණි ගමක ආර්ථික, සමාජයීය සංස්කෘතික උරුමයන් අනාගත පරපුරට දැකබලා ගැනීමට හැකිවන ලෙස සජීවී හා නිර්මිතයන් ලෙස ඉදිරිපත් කිරීම.

2.2 5 වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) සහ උසස් අධ්‍යාපනය හදාරන පාසැල් සිසුන් සඳහා ඉපැරණි ගමක් සැදුම් ලැබූ ව්‍යුහය, එහි තිබූ ආකෘතීන් හා උපකරණ මොනවාද යන්න පිළිබඳව අධ්‍යනයේ යෙදීමට ඉඩකඩ සලසා දීම.

2.3 ඉපැරණි ගමක ආර්ථික ක්‍රමවේදය පිළිබඳව දෙස් විදෙස් සංචාරකයන්ට අවබෝධයක් ලබා දීම.

2.4 ඉපැරණි ගමක තිබූ අංගයන් හා සම්ප්‍රදායික භාණ්ඩ අනාගත පරපුරට දැකබලා ගත හැකි ලෙස සංරක්ෂණය කිරීම.

2.5 පළාතේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

2.6 තේමා උද්‍යානය තුළින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

2.7 විදේශ සංචාරක ආකර්ෂණයක් ඇති කිරීම හා ඒ තුළින් විදේශ විනිමය උත්පාදනය.

2.8 මංගල අවස්ථා, විවිධ ටෙලි හා සිනමා රූගත කිරීම්, උත්සව හා සම්මන්ත්‍රණ වැනි අවස්ථා සඳහා භෞතික හා පාරිසරික වශයෙන් යෝග්‍ය ඉඩකඩක් සලසා දීම.

2.9 සබරගමුව කලා ශිල්පීන්ගේ කලා කුසලතා හා නිර්මාණ සිදුකිරීම හා අලෙවි කර ගැනීමට ඉඩකඩක් සලසා දීම.

2.10 සබරගමුව පළාත් කලාකරුවන්ගේ නර්තන හැකියාව ප්‍රදර්ශනයට අවස්ථාවන් ලබා දීම.

2.11 අනාගත උරුමන් ආරක්ෂා කිරීම වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩසටහන් හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.

2.12 පළාත් අරමුදල සඳහා ආදායම් ජනනමය ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වීම.

*තේමා උද්‍යානයේ අංගයන්*

3\. 3.1 තේමා උද්‍යානය, ශ්‍රී ලංකාවේ, සබරගමුව පළාතේ සම්ප්‍රදායික ඉපැරණි ගමක තිබූ අංගයන් නිරූපනය කරනු ලබන නිර්මිතයන්ගෙන් සමන්විත විය යුතු ය.

3.2 මෙම නිර්මිතයන් ලෙස වෙද ගෙදර, ආරච්චි ගෙදර, කෝපි කඩේ, කම්මල, වඩු මඩුව, අත්යන්ත්‍ර රෙදිපිළි ගෙදර, කුඹල් ගෙදර, මහ ගමරාළගේ ගෙදර, වැව, හේන, දඬුවැට, ගස මත බැඳි පැල, කෙත් යාය, කමත, වී බිස්ස, පන්සල, එළිමහන් රඟහල, බෙර දවුල් ගෙදර, ගුරු ගෙදර, රෙදි නැන්දාගේ ගෙදර, ඉපැරණිගම හෙළ බොජුන් හල, ඇතුල් වීමේ දොරටුව, පිට වීමේ දොරටුව, සිහිවටන අලෙවිකුටි යනාදිය සැලකිය යුතු ය.

3.3 තේමා උද්‍යානයේ අරමුණු වලට පටහැනි නොවන ලෙස නවාංග එකතු කිරීමේ බලය භාරකාර මණ්ඩලයට හිමිවේ.

4. 4.1 භාරකාර මණ්ඩලය පහත සඳහන් අයවලුන්ගෙන් සමන්විත වනු ලැබේ — භාරකාර මණ්ඩලයේ සංයුතිය
ප්‍රධාන උපදේශකත්වය - සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා
සංකල්පීය උපදේශකත්වය - ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත
සභාපතිවරයා ලෙස ප්‍රධාන අමාත්‍යංශයේ ලේකම්වරයා කටයුතු කරනු ලැබේ.
මෙහි සාමාජිකයන් ලෙස පහත සඳහන් නියෝජිතයන් කටයුතු කරනු ලැබේ.
- ප්‍රධාන අමාත්‍යවරයාගේ නියෝජිතයන් දෙදෙනෙකු
- ලේකම්, සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යංශය
- ලේකම්, සබරගමුව පළාත් සංචාරක අමාත්‍යංශය
- ලේකම්, සබරගමුව පළාත් කර්මාන්ත අමාත්‍යංශය
- ලේකම්, සබරගමුව පළාත් කෘෂිකර්ම අමාත්‍යංශය
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන)
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ)
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
- සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යංශයේ අධ්‍යක්ෂ (සැලසුම්)
- සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් විසින් පත්කරනු ලබන නිලධාරියකු

ඉහත සඳහන් නිලධාරීන් 13 දෙනෙකුගෙන් මෙම භාරකාර මණ්ඩලය සමන්විත වේ.

මෙම භාරකාර මණ්ඩලයට අදාළ පත්කිරීම් අමාත්‍යවරයා විසින් සිදුකරනු ලැබේ.

5. 5.1 භාරකාර මණ්ඩලයේ නිල කාලය වසර 03 කි. වසර තුනක කාලයෙන් පසු අමාත්‍යවරයා විසින් භාරකාර මණ්ඩලය සාමාජිකයන් නැවත පත් කළ යුතු ය. — භාරකාර මණ්ඩලයේ නිල කාලය හා කාර්ය භාරය.

5.2 භාරකාර මණ්ඩලයේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

(අ) මසකට වරක් හෝ දෙවරකට නොවැඩි වාර ගණනක් රැස්වී අවශ්‍ය පරිදි කළමනාකරණය අදාළ තීන්දු තීරණ ගැනීම භාරකාර මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(ආ) සේවකයන් බඳවා ගැනීම, උසස් කිරීම, විනය නීති රීති සම්පාදන බලය, සේවයෙන් යම් සේවකයකු විනයානුකූලව වැරදි කර ඇතිනම් පහ කිරීමේ බලය, කොන්ත්‍රාත්/අනියම්/ආදේශක පදනම මත බඳවා ගැනීමේ බලය, මෙම භාරකාර මණ්ඩලය වෙත පැවරේ.

(ඇ) තේමා උද්‍යානය සඳහා ස්ථිර, කොන්ත්‍රාත්/අනියම්/ආදේශක පදනම මත බඳවා ගන්නා සියලුම ශ්‍රේණි වල නිලධාරීන්ගේ වැටුප් නීර්ණය කිරීමේ බලය මෙම භාරකාර මණ්ඩලය සතුවේ.

(ඉ) සියලුම සේවකයන්ගේ විනය බලධාරියා ලෙස මෙම භාරකාර මණ්ඩලය කටයුතු කරනු ලැබේ.

(ඊ) කොන්ත්‍රාත් පදනම මත සිටින සියලු සේවකයන්ගේ සේවා කාලය දීර්ඝ කිරීමේ බලය මෙම භාරකාර මණ්ඩලය සතුවේ.

(උ) දේශීය හා විදේශිකයන්ට ඉපැරණි ගමක ස්වරූපය නිර්මාණය වන අයුරින් ඉපැරණි ගම සඳහා අවශ්‍ය අංග එකතු කිරීමේ බලය භාරකාර මණ්ඩලයට හිමිවේ.

(ඌ) අමාත්‍යවරයාගේ අනුමැතිය මත භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ රැස්වීම් සඳහා සහභාගීත්ව දීමනාව භාරකාර මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

(එ) විදේශීය සංචාරකයන් තේමා උද්‍යානයට රැගෙන ඒම ප්‍රවර්ධනය සඳහා සංචාරක නියෝජිතායතන, සංචාරක මඟ පෙන්වන්නන් සඳහා දිරිගැන්වීම් දීමනා තීරණය කිරීමේ බලය භාරකාර මණ්ඩලයට හිමිවේ.

(ඒ) දේශීය හා විදේශීය වශයෙන් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගැනීමට හා ක්‍රියාවට නැංවීමට භාරකාර මණ්ඩලයට බලය ඇත.

(ඔ) තේමා උද්‍යානය විවෘතව තබන වේලාවන් හා සේවකයන්ගේ රාජකාරි වේලාවන් පිළිබඳ භාරකාර මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

6. 6.1 තේමා උද්‍යානයේ පිහිටුවනු ලබන භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා ක්‍රියාකරනු ලබයි. භාරකාර මණ්ඩලයේ මුලසුන දැරීම හා තේමා උද්‍යානය ක්‍රියාවට නැංවීම සඳහා පිහිටුවනු ලබන භාරකාර මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් හා ප්‍රධාන ප්‍රතිපත්ති තීරකයා ලෙස ඔහු ක්‍රියාකරනු ලැබේ. — භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා

6.2 සභාපති ධූරයේ රාජකාරි ඉටුකිරීම සඳහා ඔහු දූනට ලබන වැටුපෙන් 1/3 ක් වැඩ බැලීමේ දීමනාවක් ලෙස ලබා දීමට භාරකාර මණ්ඩලයට හැකියාව ඇත.

භාරකාර මණ්ඩලයේ ලේකම්වරයා

7. 7.1 මේ සඳහා තේමා උද්‍යානයේ ප්‍රධාන විධායක නිලධාරියා භාරකාර මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කරනු ලැබේ. භාරකාර මණ්ඩලයේ රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම ඔහුගේ කාර්යභාරයක් වේ.

භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා නොමැති අවස්ථාවල රැස්වීම් පැවැත්වීම.

8. 8.1 තේමා උද්‍යානයේ භාරකාර මණ්ඩලයේ රැස්වීම සඳහා සභාපතිවරයා පැමිණ නොසිටින විට එහි පැමිණ සිටින සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු එදින රැස්වීමේ සභාපතිවරයා ලෙස පත්කර ගැනීමට සාමාජිකයන් සඳහා බලය හිමිවේ.

සන පූර්ණය

9. 9.1 භාරකාර මණ්ඩලයේ සමස්ත සාමාජිකයන් ගණන 13 කි. එහි සාමාජිකයන් 07 ක් හෝ ඊට වැඩි පිරිසක් පැමිණ ඇති විට භාරකාර මණ්ඩල රැස්වීමේ සනපූර්ණය සම්පූර්ණ වූවා සේ සැලකේ.

භාරකාර මණ්ඩලය සම්බන්ධව අමාත්‍යවරයාගේ බලතල

10. 10.1 අමාත්‍යවරයාට පහත සඳහන් බලතල හිමිවේ.
- (අ) තම අභිමතය පරිදි විශේෂ රැස්වීම් සාකච්ඡා සඳහා සාමාජිකයන් කැඳවීමේ බලය.
- (ආ) භාරකාර මණ්ඩලය සඳහා සාමාජිකයන් පත්කිරීමේ/ඉවත් කිරීමේ බලය.
- (ඇ) සාමාජිකයකු යම් දූෂණ, විනය විරෝධී කටයුත්තකට සම්බන්ධ වන බවට හෙළිවන්නේ නම් හෝ රැස්වීම් වාර තුනකට වැඩියෙන් නොපැමිණෙන්නේ නම් සාමාජිකයන් ඉවත් කිරීමේ බලය.
- (ඈ) බැංකු ගිණුම් හා මූල්‍ය තොරතුරු හා ආයතනික තොරතුරු ඉල්ලා ඇති විටෙක ලබා දීමට භාරකාර මණ්ඩලය බැඳී සිටී.

භාරකාර මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

11. 11.1 පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක නගරාධිපති/සභාපතිවරයකු හට මෙම භාරකාර මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීමට අවකාශ නොමැත.

11.2 ශ්‍රී ලංකාවේ අධිකරණයකින් වරදකරුවකු බවට තීරණය කර ඇති පුද්ගලයකුට මෙහි සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට හිමිකමක් නොමැත.

භාරකාර මණ්ඩලය සඳහා අලුතින් සාමාජිකයන් පත් කිරීම

12. 12.1 භාරකාර මණ්ඩලය සඳහා අමාත්‍යවරයාගේ නියෝජිතයන් ලෙස පත් කරනු ලබන සාමාජිකයකු ඉවත් වීමක දී හෝ මිය ගිය විටක හෝ වෙනත් හේතුවක් මත ඉවත් කිරීමට ලක්වීමකට සිදුවූ විට ඇතිවන පුරප්පාඩුව සඳහා වෙනත් අයෙකු ඉදිරි අවශේෂ කාලය සඳහා පත් කිරීමට අමාත්‍යවරයා වෙත බලය ඇත්තේ ය.

12.2 භාරකාර මණ්ඩලය සඳහා ප්‍රධාන ලේකම්වරයාගේ නියෝජිතයකු ලෙස පත් කරනු ලබන සාමාජිකයා ඉවත් වීමක දී හෝ මිය ගිය විටක හෝ වෙනත් හේතුවක් මත ඉවත් කිරීමට ලක්වීමකට සිදුවූ විට ඇතිවන පුරප්පාඩුව සඳහා වෙනත් අයෙකු ඉදිරි අවශේෂ කාලය සඳහා පත් කිරීමට ප්‍රධාන ලේකම්වරයා වෙත බලය ඇත්තේ ය.

12.3 අනෙකුත් සාමාජිකයින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමේ දී හෝ ස්ථාන මාරුවකදී හෝ උසස් වීමක දී හෝ ඉල්ලා අස්වීමක දී හෝ මිය යාමක දී ඔහුගේ අනුප්‍රාප්තිකයා ලෙස පළාත් සභාවේ අදාළ තනතුරට පත් වන අනුප්‍රාප්තික නිලධාරියා නිල බලයෙන් භාරකාර මණ්ඩලය සඳහා පත් කිරීමට අමාත්‍යවරයා කටයුතු කළ යුතු ය.

භාරකාර මණ්ඩලයේ සාමාජිකයකු ඉල්ලා අස්වීම

13. 13.1 ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයන් හා ප්‍රධාන ලේකම්වරයා විසින් පත් කරනු ලබන නියෝජිතයා යන තිදෙනාගෙන් අයකු හට ස්ව කැමැත්තෙන් ඉල්ලා අස්වීමට අවශ්‍ය වන්නේ නම් ලිත් මසක් ඇතුළත අමාත්‍යවරයා, ප්‍රධාන ලේකම්වරයා හා භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා දැනුවත් කර ඉවත් විය හැකි ය.

තේමා උද්‍යානයේ ගිණුම පිහිටුවීම

14. 14.1 තේමා උද්‍යානය සඳහා ''පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය'' යනුවෙන් හඳුන්වන බැංකු ගිණුමක් රාජ්‍ය බැංකුවක වෙනමම පවත්වාගෙන යා යුතු ය.

14.2 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 වන කොටසේ විධිවිධානයන්ට ''පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය'' ගිණුම යටත් වන්නේ ය.

14.3 පහත සඳහන් ලැබීම් ''පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය'' ගිණුමට බැරවීමට හිමිකම ලබන්නේ ය.
- (අ) සබරගමුව පළාත් සභා අරමුදල මගින් ලබා දෙන මුදල් හා පරිත්‍යාග
- (ආ) තේමා උද්‍යානය මගින් උපයනු ලබන ආදායම්
- (ඇ) රජයේ අමාත්‍යංශයක්/දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් ආයතනයක් විසින් නීත්‍යානුකූලව ලබා දෙනු ලබන මුදල් හා පරිත්‍යාග
- (ඈ) රාජ්‍ය නොවන සංවිධාන, මහජනතාව, ස්වේච්ඡා සංවිධාන හා ජාත්‍යන්තර සංවිධාන වලින් ලැබෙන මුදල්, ත්‍යාග හා පරිත්‍යාග

15. 15.1 තේමා උද්‍යානය පිහිටුවීමේ දී අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට හෝ අරමුණු ළඟා කරගැනීම සඳහා දරනු ලබන සියලු වියදම් ගිණුමෙන් ගෙවිය යුතු ය. මුදල් හා දේපල යෙදවීම

15.2 මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ බද්දක් ගෙවීමේ දී සියලු කටයුතු පවත්නා මුදල් රෙගුලාසි/මූල්‍ය රීති යටතේ ගෙවීමට පිහිටුවනු ලබන භාරකාර මණ්ඩලයට හැකියාව හා බලය ඇත්තේ ය.

15.3 සබරගමුව පළාත් සභාවේ හෝ ප්‍රධාන අමාත්‍යාංශයේ චක්‍රලේඛන හා අනපනත්වලට යටත්ව යම් දේපළක් විකිණීම, උකස් කිරීම හෝ බදු දීම සිදුකිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව පිහිටුවනු ලබන භාරකාර මණ්ඩලයට බලය හිමිවේ.

16. 16.1 පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදේශකත්වය යටතේ රජයේ මූල්‍ය රෙගුලාසි වලට යටත්ව ගිණුම නිසි පරිදි පරිපාලනය කළ යුතු ය. ගිණුම් පාලනය

16.2 පිහිටුවනු ලබන ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

16.3 භාරකාර මණ්ඩලය විසින් තේමා උද්‍යානයේ ආදායම, වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

16.4 රාජ්‍ය සංස්ථාවක ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන තේමා උද්‍යානයේ ගිණුම විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

16.5 විගණන වාර්තාව ලැබීමෙන් පසු එළැඹෙන පළමු රැස්වීමේ දී එම වාර්තාව භාරකාර මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

17. 17.1 චෙක්පත් අත්සන් කිරීමේ බලය, භාරකාර මණ්ඩලයේ සභාපති හෝ ප්‍රධාන විධායක නිලධාරී සමග මූල්‍ය සහකාර හෝ කළමනාකරු වෙත පැවරේ. චෙක්පත් අත්සන් කිරීමේ බලය

18. 18.1 ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීම කාර්ය මණ්ඩල බඳවා ගැනීම

(අ) තේමා උද්‍යානය සඳහා අමාත්‍යවරයාගේ උපදෙස් මත සබරගමුව පළාත් සභාවෙ ස්ථිර සේවයේ නියුතු දීප ව්‍යාප්ත සේවයක නිලධාරියකු මෙහි ''ප්‍රධාන විධායක නිලධාරී'' ලෙස පත් කළ යුතු ය. මෙම පත්කිරීම භාරකාර මණ්ඩලයේ එකඟතාවයෙන් ලේකම් විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය මත සිදුකළ යුතු ය. ඒ සඳහා ඔහුට වැඩ බැලීම සඳහා ඔහු දැනට ලබන වැටුපෙන් 1/3ක් වැඩ බැලීමේ දීමනාවක් ලෙස ලබා දීමට භාරකාර මණ්ඩලයට හැකියාව ඇත.

- නැතහොත් -

(ආ) එසේ පත් නොකරන විටක දී පූර්ණ කාලීනව ප්‍රධාන විධායක නිලධාරියකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය. මේ සඳහා වැටුප්, දීමනා භාරකාර මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය මත තීරණය කළ යුතු ය.

(ඇ) මෙම ප්‍රධාන විධායක නිලධාරී පූර්ණ කාලීනව පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් භාරකාර මණ්ඩලය විසින් හඳුනාගත යුතු ය.

(ඈ) අමාත්‍යාංශයේ එක් ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන තේමා උද්‍යානයෙහි සාමාන්‍ය පාලනය පවත්වාගෙන යෑම, මූල්‍ය පාලනය, සේවක මණ්ඩල පාලනය හා නිර්මාණශීලී ආකාරයට ලාභදායී ආයතනයක් ලෙස භාරකාර මණ්ඩලයේ උපදෙස් හා අනුමැතිය මත තේමා උද්‍යානය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය වේ.

18.2 තේමා උද්‍යානය සඳහා පහත සඳහන් පරිදි නිලධාරීන්ගෙන් සැදුම්ලත් ස්ථිර / අනියම් / ආදේශක /කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට භාරකාර මණ්ඩලයට බලය පැවරේ. ඒ ඒ තනතුරු සඳහා බඳවා ගත යුතු නිලධාරී/සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමට අදාළ සුදුසුකම් භාරකාර මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

(අ) කළමනාකරු
(ආ) මූල්‍ය සහකාර
(ඇ) සිංහල, දෙමළ හා ඉංග්‍රීස භාෂා මාර්ගෝපදේශකයන්
(ඈ) ප්‍රවේශ පත්‍ර කවුළු සඳහා අයකැමියන්
(ඉ) නඩත්තු කම්කරුවන්
(ඊ) මුරකරුවන්
(උ) වාහන නැවතුම්පොල ටිකට් නිකුත් කරන්නන්

18.3 තේමා උද්‍යානය සඳහා සේවා අවශ්‍යතාවය මත කාර්යයන් සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ඉහත සඳහන් කර ඇති කාර්ය මණ්ඩලයට අමතරව සේවකයන් බඳවා ගැනීමට භාරකාර මණ්ඩලයට බලය ඇත.

18.4 කාර්ය මණ්ඩලයේ ඒ ඒ තනතුරු සඳහා බඳවා ගත් අයගේ කොන්ත්‍රාත්/අනියම්/ආදේශක කාලය දීර්ඝ කිරීමට භාරකාර මණ්ඩලයට බලය ඇත.

18.5 අනියම්, තාවකාලික හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගනු ලබන සියලුම සේවකයන් වර්ෂයක කාල සීමාවෙන් පසු ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට භාරකාර මණ්ඩලය කටයුතු කළ යුතු ය.

(අ) මෙහි දී විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණ පවත්වා නිසි කාර්යසාධන හැකියාවක් පෙන්නුම් කරනු ලබන සුදුසුකම් ලත් සේවකයන් පමණක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගත යුතු ය.

(ආ) සේවකයන් කොන්ත්‍රාත් පදනම යටතේ තබා ගැනීමේ කාලය දීර්ඝ කිරීම සඳහා භාරකාර මණ්ඩලයට හැකියාව ඇත.

(ඇ) මෙම සේවකයන් ස්ථිර කළ විට වැටුප් හා ජීවන වියදම් දීමනා ගෙවීමට කටයුතු කරනු ලබන අතර, සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට අදාළව සිදු කළ යුතු ගෙවීම් භාරකාර මණ්ඩලය මගින් සිදුකළ යුතු ය.

(ඈ) මෙම සියලුම සේවකයන්ගේ ස්ථිර කිරීමේ දී වැටුප් පරිමාණ සකස් කිරීම, උසස් වීම් පද්ධතියක් සකස් කිරීම, පුහුණු කිරීම හා විනය පාලනය පිළිබඳ තීන්දු තීරණ ගැනීම භාරකාර මණ්ඩලය විසින් සිදුකරනු ලැබිය යුතු ය.

(ඉ) සේවා අවශ්‍යතාවය මත තේමා උද්‍යානයේ කාර්ය මණ්ඩලයේ තනතුරු හා සංඛ්‍යාව සංශෝධනය කිරීමේ බලය භාරකාර මණ්ඩලය සතුවේ.

(ඊ) සේවකයන්ට අදාළ රාජකාරි නීර්ණය කිරීමේ හැකියාව භාරකාර මණ්ඩලයට ඇත.

(උ) මෙම බඳවා ගනු ලබන සියලුම සේවකයන් පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ලෙස සැලකිය යුතු ය.

(ඌ) මෙම බඳවා ගනු ලබන සියලුම සේවකයන් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා සබරගමුව පළාත් මූල්‍ය රීති හා කලින් කළට පනවනු ලබන චක්‍රලේඛ හා අණපනත්, ප්‍රඥප්තිවලට යටත් විය යුතු ය.

(එ) ඔවුන් විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ චේතනාන්විත නොවන අයුරින් කරනු ලබන ක්‍රියාවන් සම්බන්ධයෙන් වන අලාභයක් හෝ හානියක් පූර්ණය කිරීමට අදාළව තීරණ ගැනීමට භාරකාර මණ්ඩලයට බලය හිමිවේ.

ප්‍රදර්ශකයන්

19\. 19.1 අදාළ නිර්මිතයන්හි සම්ප්‍රදායිකත්වය පෙන්නුම් කරන අයුරින් දෙස් විදෙස් සංචාරකයන්ට ඉපැරණි ගමක උරුමය පිළිබඳ දැනුම සැපයීම, එය සජීවීව නැරඹීමට ඉඩකඩ සලසා දීම හා සම්ප්‍රදායික භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කිරීම ප්‍රදර්ශකයන්ගේ කාර්යභාරය වේ.

19.2 ඒ ඒ නිර්මිතයන්ට අදාළ ප්‍රදර්ශකයන්ගේ කාර්යභාරය අනුව ඔවුන් ආදායම් ලබන්නේ ද නොලබන්නේ ද යන්න තීරණය කිරීම භාරකාර මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

19.3 මෙම නිර්මිතයන්හි සිටින ප්‍රදර්ශකයන්ට භාරකාර මණ්ඩලය විසින් හඳුනා ගනු ලබන ජීවන වියදම් දීමනාවක් ගෙවීමට කටයුතු කළ හැකි ය.

19.4 ප්‍රදර්ශකයන් බඳවා ගැනීමට භාරකාර මණ්ඩලය විසින් කටයුතු කළ යුතු අතර ඔවුන්ගේ කාර්යසාධනය අනුව කොන්ත්‍රාත් කාලය වාර්ෂිකව දීර්ඝ කරනු ලබන්නේ ද නැද්ද යන්න භාරකාර මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

එළිමහන් රඟහල සඳහා ඉදිරිපත් කරන්නන්

20\. 20.1 තේමා උද්‍යානයට එළිමහන් රඟහලක් ඇතුළත් වේ.

(අ) එළිමහන් රඟහල තුළ නාට්‍ය/නර්තන සිදුකිරීම සඳහා භාරකාර මණ්ඩලය විසින් නිශ්චිත කාලයක් සඳහා කලායතනයක් හඳුනා ගනු ලැබිය යුතු ය.

(ආ) මෙහි දී කලායතනයක් හඳුනා ගැනීමේ දී පළමුව රඹුක්කන ප්‍රදේශයේ කලායතන සඳහාත්, දෙවනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ කලායතන සඳහාත්, තෙවනුව රත්නපුර දිස්ත්‍රික්කයේ කලායතන වෙතත් ප්‍රමුඛතාවය හිමි විය යුතු ය.

(ඇ) මෙහිදී දේශීය හා විදේශීය සංචාරකයන් හට නර්තනාංග ඉදිරිපත් කිරීමෙන් ලබන ආදායමෙන් කොටසක් කලායතනය හට ලබා දීමට භාරකාර මණ්ඩලය විසින් සිදු කළ යුතු ය. අදාළ ප්‍රතිශතය හා නර්තන සංදර්ශන නැරඹීම සඳහා සංචාරකයන් වෙතින් අයකරනු ලබන ගාස්තු භාරකාර මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

(ඈ) කොහොඹා කංකාරිය, දහඅට සන්නිය, සබරගමු නැටුම්, වෙස් නැටුම්, ඉපැරණි ගමක යාගහෝම ක්‍රමවේද, බලි තොවිල් වැනි දේ පිළිබඳව දේශීය, විදේශීය සංචාරකයන් හා පාසැල් සිසුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.

(ඉ) මෙම නර්තන ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත කාල රාමුවක් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඊ) කලායතන හා කලාකරුවන් හඳුනා ගැනීම, ඔවුන්ගේ කොන්ත්‍රාත් කාලය නීර්ණය හෝ සහභාගීත්ව දීමනා තීරණය කිරීම භාරකාර මණ්ඩලය මගින් සිදුකරනු ලැබිය හැක.

21. 21.1 තේමා උද්‍යානයේ එළිමහන් රඟහල කුලී පදනම මත ලබා දීම සඳහා අයකරනු ලබන දෛනික කුලිය හෝ ගාස්තුව භාරකාර මණ්ඩලයට තීරණය කළ හැක. එළිමහන් රඟහල නාට්‍ය, සංදර්ශන හා දේශීයත්වය ඉස්මතු කරන වැඩසටහන් සඳහා කුලී පදනම මත ලබා දීමට භාරකාර මණ්ඩලයට හැක. — එළිමහන් රඟහල කුලී පදනම මත ලබා දීම

22. 22.1 තේමා උද්‍යානයේ පිටවීම් දොරටුව අසළ ඇති ප්‍රදර්ශන කුටි භාරකාර මණ්ඩලය විසින් විධිමත් ක්‍රමවේදයක් යටතේ හඳුනා ගන්නා රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ආයතන සඳහා බදුකුලී පදනම යටතේ ලබා දීමට කටයුතු කළ හැකි ය. — ප්‍රදර්ශන කුටි බදුකුලී පදනම මත ලබා දීම

22.2 තේමා උද්‍යානයට අනන්‍ය වූ කලාත්මක භාණ්ඩ අලෙවිය, සබරගමුව පළාතේ කලා ශිල්පීන්ගේ නිර්මාණ අලෙවිය හා ජාතික වශයෙන් වැදගත් කලා නිර්මාණ දෙස් විදෙස් සංචාරකයන්ට හඳුන්වා දීම හා අලෙවි කිරීම සඳහා මෙම ප්‍රදර්ශන කුටි යොදා ගත යුතු ය.

22.3 කිසිදු විටෙක කෘතිම හෝ සම්ප්‍රදායික නොවන නිෂ්පාදන හඳුන්වා දීමට හෝ අලෙවි කිරීමට මෙම ප්‍රදර්ශන කුටි තුළ ඉඩ ප්‍රස්ථා ලබා නොදිය යුතු ය.

22.4 ප්‍රදර්ශන කුටි සඳහා අයකරනු ලබන බදු කුලිය භාරකාර මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

23. 23.1 තේමා උද්‍යානය යොදා ගනිමින් ඡායාරූප හා වීඩියෝ දර්ශන ව්‍යාපාරික මට්ටමෙන් සිදුකරන්නන් වෙතින් භාරකාර මණ්ඩලය විසින් හඳුනා ගන්නා ගාස්තුවක් අය කළ යුතු ය. — ඉසව් කළමනාකරණය

24. 24.1 අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව තේමා උද්‍යානයේ ආරම්භක අරමුණු වලට හානියක් නොවන ලෙස දේශීය හා ඉපැරණි අංගයන් මෙන්ම නවාංග එකතු කිරීමට භාරකාර මණ්ඩලයට කටයුතු කළ හැක. — නව අංග ඇතුළත් කිරීම

25. 25.1 ආදායම් උත්පාදන මට්ටමට ළඟා වන තෙක් තේමා උද්‍යානය පවත්වාගෙන යාම වෙනුවෙන් වර්ෂයකට වැයවෙතැයි භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදනයක් සබරගමුව පළාත් අරමුදල මගින් තේමා උද්‍යානය වෙත ආපසු නොගෙවන පදනම මත ලබා දීමට කටයුතු කළ හැකි ය. — ආරම්භක අරමුදල්

25.2 මෙම ආරම්භක ප්‍රාග්ධනය ලබා දීම ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත සිදුකළ යුතු ය.

25.3 තේමා උද්‍යානයේ ආදායම් උත්පාදන ක්‍රියාවලියේ බිඳ වැටීමක් හෝ මූල්‍ය දුෂ්කරතා පැනනගින අවස්ථාවල දී මාස 06 ක කාලයක් සඳහා ප්‍රමාණවත් වන පරිදි වැටුප් හා නඩත්තු සඳහා සබරගමුව පළාත් අරමුදලින් සමාන වාරික 10 කින් ගෙවා නිම කළයුතු ණය මුදලක් පොලී රහිතව ලබා දීමට සබරගමුව පළාත් සභාවට කටයුතු කළ හැකි ය.

26. 26.1 ව්‍යාපෘතිය ආරම්භ කරන දිනයේ සිට වර්ෂයක කාලයක් දක්වා එහි කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා අයවලුන් බාහිරින් බඳවා ගන්නා තෙක් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්/සේවකයන් අනුයුක්ත කිරීමට සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් කටයුතු කළ හැකි ය. — අන්තර්කාලීන විධිවිධාන

27. 27.1 මෙම ප්‍රඥප්තිය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන පිටපත් තුනකින් නිර්මාණය වන අතර යම් ගැටළුකාරී කරුණක් සම්බන්ධයෙන් නිවැරදි අර්ථ නිරූපණය ලබාගත යුත්තේ සිංහල පිටපතිනි. — ව්‍යාකූලතාවයක් ඇති විටෙක නීතිමය බලගැන්වීම

03 - 718

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.